# <u>උපදෙස් පත්‍රිකාව</u>

1998 අංක 45 දරණ පෞද්ගලික ආරක්‍ෂක නියෝජ්‍යායතන විධිමත් කිරිමේ පනත අනුව දැනට මෙම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වි ඇති / ලියාපදිංචි වීමට අපේක්‍ෂා කරන පෞද්ගලික ආරක්‍ෂක නියෝජ්‍යායතන පහත දැක්වෙන උපදෙස් අනුගමනය කල යුතුයි.

- www.defence.lk වෙබ් අඩවිය මඟින් අයදුම්පත සහ අවශ්‍ය ලේඛන පිළිබඳ තොරතුරු බාගත කළ යුතුයි.
- සම්පූර්ණ කරන ලද අයදුම් පත සමඟ ඉදිරිපත් කරනු ලබන මුල් පිටපත් නොවන ලේඛන නීතිඥවරයෙකු හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සත්‍ය පිටපත් බවට සහතික කළ යුතුයි.
- ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය අනුව අතිරේක ලේකම් (රාජ්‍ය ආරක්‍ෂක) ගේ අනුමැතිය ලද බව දැනුම් දීමෙන් පසු ආරක්‍ෂක නියෝජ්‍යාතනය ලියාපදිංචි කිරීම සඳහා අදාල ගාස්තු ගෙවීම සිදුකල යුතුයි.
- **සියළුම ලියාපදිංචි ගාස්තු /ප්‍රමාද ගාස්තු/ පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනයේ නම,මුදල් තැන්පත් කරනු ලබන කාරණය ( මුල් වරට ලියාපදිංචි කිරිම/ ලියාපදිංචිය අළුත් කිරිම) සඳහන් කර ලේකම්, ආරක්‍ෂක අමාත්‍යාංශය නමින් ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාවේ ඇති ගිණුම් අංක 0007040119 ට බැර කර, ලදුපතේ මුල්පිටපත ආරක්‍ෂක මූලස්ථාන සංකීර්ණයේ ප්‍රධාන දොරටුවෙහි සිවිල් ආරක්‍ෂක හා සංවර්ධන අංශයේ මුදල් භාර ගන්නා ස්ථානය වෙත ඉදිරිපත් කර මුදල් භාර ගැනීමේ කුවිතාන්සියක් (පොදු ආකෘති පත්‍ර 172 ) ලබා ගත යුතුයි.**
- මුදල් භාර ගැනීමේ කුවිතාන්සිය (පොදු ආකෘති පත්‍ර 172) ඉදිරිපත් කිරීමෙන් පසු ලියාපදිංචි බලපත්‍රය නිකුත් කිරීම සිදු කරනු ලැබේ.
- පෞද්ගලික ආරක්‍ෂක නියෝජ්‍යාතනයේ ආරක්‍ෂක කළමනාකරු වයස අවුරුදු 75 නොඉක්ම වූ අයෙකු විය යුතුයි.
- ආරක්‍ෂක කළමනාකරුවෙකු ලෙස සුදුසු කම් සපුරා ඇති නිලධාරීන් එක් ආරක්‍ෂක ආයතනයක පමණක් ආරක්‍ෂක කළමනාකරුවෙකු ලෙස සේවය කල යුතුයි.
- පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන වල සේවයේ නියුතු ආරක්ෂක නියාමකයින් සඳහා භාවිතා කරන නිල ඇඳුම සහ ආයිත්තම් ත්‍රිවිධ හමුදා පොලිසීය සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිල ඇඳුම් සමග සමාන නොවිය යුතු බැවින් ඒ බව දිවුරුම් ප්‍රකාශක් මඟින් සනාථ කල යුතුයි.
- පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතනයන්හි සේවය කරන සේවකයෙකු / නිලධාරියෙකු විසින් මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරිම / ගිනි අවි අව භාවිතය / අනුමත නොවන නිල ඇඳුම් භාවිතය/ ආදී නීති විරෝධී කටයුතු සම්බන්ධයෙන් අත් අඩංගුවටට පත් වී හෝ සම්බන්ධ වී ඇති බවට කරුණු අනාවරණ වුවහොත් ලියාපදිංචි බලපත්‍රය අහෝසි කරණු ලැබේ.

- **<u>පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන වෙත නිකුත් කර ඇති වලංගු බලපත්‍රයෙහි වලංගු කාල සීමාව ඉක්මවීමට මාස 03 කට පෙර ලියාපදිංචිය අළුත් කිරිම සඳහා අයදුම්පත සමඟ අදාල ලේඛන ඉදිරිපත් කළ යුතුය.</u>**